2020

වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
Annual Report

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

இலங்கை அச்சக நிறுவகம்
திறன்கள் அபிவிருத்தி, தொழில்கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்கல் இராஜாங்க அமைச்சு

SRI LANKA INSTITUTE OF PRINTING
State Ministry of Skills Development, Vocational Education, Research and Innovation

වාර්ෂික වාර්තාව
2020

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

(1984 පාර්ලිමේන්තු පනතකින් ස්ථාපනය කරන ලදි)

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
දුරකථන : 0112686162, 0112679791
ෆැක්ස් : 0112686162
ඊ මේල් : sliopreg@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

නම	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
ස්ථාපනය	1984 අංක 18 දරණ පාර්ලිමේන්තු ආඥා පනත අනුව පිහිටුවා ඇත. 1985 අංක 16 දරණ දේශිය ආදයම් සංශෝධන පනත අනුව ආදයම් බදුවලින් නිදහස් කොට ඇත.
ලිපිනය	නො. 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථනය	0112686162, 0112679791
ෆැක්ස්	0112686162
ලියාපදිංචි කාර්යාලය	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව නො. 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
බැංකු	මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ලංකා බැංකුව.
විගණනය	1. ඩී. එච්. පී. මුණවීර සහ සමාගම 2. විගණකාධිපති දෙපාර්තමේන්තුව

පටුන

	පිටුව
1.හැඳින්වීම	01
2.ආයතනික උපක්‍රම හා කාර්ය භාරයන්	03
3.ආයතනයේ අරමුණු	03
4.ආයතනයේ ශක්තිය	03
5.දැක්ම සහ ආකල්ප	05
6.පාලනඅධිකාරිය	07
7.කාර්යමණ්ඩලය	07
8.ආයතනික ව්‍යුහය	09
9.කථිකාචාර්ය මඩුල්ල	11
10.ශාඛාවන්	13
11.පුහුණු පාඨමාලා	15
12.වැඩමුලු හා සම්මන්ත්‍රණ	16
13.වෘත්තීය සංවර්ධන මාර්ගය	17
14.ශිෂ්‍ය දත්ත	19
15.මූල්‍ය දත්ත	20
16.වාර්ෂික ගිණුම් වාර්තාව	21
17.විගණකාධිපති වාර්තාව සහ ආයතනික පැහැදිලි කිරීම	41
18.මධ්‍ය කාලීන ක්‍රියා මාර්ග	51

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තයේ ප්‍රථම වෘත්තීය සන්ධානය වූ මෙම ආයතනය, එම ක්ෂේත්‍රයට අදාල දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරන අතර එහි ආරම්භක මූලික අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා නිරන්තරව යෙදී සිටී.

වර්ෂ 1984 දී පාර්ලිමේන්තු ආඥා පනතක් මගින් මෙම ආයතනය ප්‍රවෘත්ති හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදී. එය මුද්‍රණ කර්මාන්තයට අදාල විද්‍යා සහ කාර්මික අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහාත්, එම කාර්මිකයින්ගේ හැකියාවන් ඔප් නැංවීම සඳහාත් නොකඩවා පුළුල් වන ශිල්පීය ක්‍රම සහ දැනුම ප්‍රවර්ධනය කිරීම සඳහාත් දියත් කළ ලාභ නොලබන සංවිධානයකි. එහෙයින් මෙම ආයතනයේ මූලික කාර්යභාරය වනුයේ රටෙහි සමාජ - ආර්ථික වර්ධනයට සරිලනසේ මෙම කර්මාන්තයේ නවීකරණයට අවශ්‍ය සහය ලබාදීමය.

ආයතනික උපක්‍රම සහ කාර්‍යය භාරයන්:

වෙළඳ සහ වාණිජ ක්ෂේත්‍රයේ ශීඝ්‍රයෙන් පුළුල් වන්නා වූ තරඟකාරී පසුබිමක් තුල මුද්‍රණ සහ ගැෆික්ස් කර්මාන්තයේ දිනෙන් දින වර්ධනය වන නවීන තාක්ෂණය සහ කළමනාකරණ අවශ්‍යතාවයන් අනුව ශිල්ප ක්‍රමය දැනුම සහ හැකියා වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ස්වකීය උපක්‍රම සහ කාර්‍ය භාරයන් නැවත සකස් කිරීමේ, ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක මෙන්ම අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහිද නිරතව සිටී.

ආයතනයේ අරමුණු:

- ශ්‍රී ලංකාවේ මුද්‍රණ ව්‍යාපාරයේ ප්‍රමිතිය නගා සිටුවීම සඳහා පවත්නා ශිල්පීය ක්‍රම, අමුද්‍රව්‍ය භාවිතය සැලසුම් කිරීම වැනි විෂයන් පිළිබඳ මුද්‍රණ ක්ෂේත්‍රයේ සේවකයන් පුහුණු කිරීම.

- මුද්‍රණ තාක්ෂණය හා කළමණාකරණය පිළිබඳව පුහුණු පාඨමාලා සංවිධානය කිරීම.

- ආයතනය මගින් මෙහෙයවනු ලබන පුහුණු පාඨමාලා සඳහා සහතික සහ ඩිප්ලෝමා පිරිනැමීම.

- මුද්‍රණ ව්‍යාපාරයට අදාල නව විෂයමාලා සහ ශිල්පීය ක්‍රම පිළිබඳව සහ පවත්නා පාඨමාලා පිළිබඳව තොරතුරු සකස් කර පත්‍රිකා සහ වෙනත් වාරික ප්‍රකාශන මගින් සැපයීම සහ බෙදාහැරීම.

- විදේශීය මුද්‍රණ පාසැල් හෝ මුද්‍රණාලයන්හි පුහුණුව සඳහා දේශීය සිසුන්ට අනුග්‍රහය ලබාදීම සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් මගින් විදේශීය සිසුන්ට එම පහසුකම් මෙහි ලබාදීම.

- මෙරට මුද්‍රණ කර්මාන්තයේ උන්නතිය සඳහා මුද්‍රණ ව්‍යාපාරයේ නවීනතම ශිල්පීය ක්‍රමවේද සහ තොරතුරු ලබාගැනීම සඳහා විදේශීය වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගිවීම.

ආයතන ශක්තිය:

වසර 15 කට අධික කාලයක් ඔස්සේ පුහුණු ආයතනයක් වශයෙන් මුද්‍රණ කර්මාන්තයට අදාල මූලික කටයුතු පිළිබඳව නිපුණත්වයක් ලබා ඇත්තා වූ මෙම ආයතනය, දැන් මෙම ක්ෂේත්‍රයේ ප්‍රධානතම ශිල්ප ආයතනය බවට පත්ව ඇති මෙම කර්මාන්තයේ සෑම අංශයක්ම ආවරණය වනසේ මැනවින් සකස් කළ ගැඹුරින් හැදෑරිය හැකි පුහුණු පාඨමාලාවන් සපයන මෙම ආයතනය උසස් මට්ටමේ පරිගණක ඒකකයකින් සහ යන්ත්‍රෝපකරණ වලින්ද සමන්විතය. එමගින් අභ්‍යාසලාභීන්ට ඒවා පරිහරණය කිරීම පිළිබඳව මනා අවබෝධයක් සහ පුහුණුවක් ලබා ගතහැක. එමෙන්ම මෙහි වඩාත්ම කැපී පෙනෙන ලක්ෂණය වනුයේ තමන් සතු වඩාත් නවීනතම විශේෂඥ දනුම නිතිපතා ලබාදෙමින් නොකඩවා අභ්‍යාසලාභීනට මග පෙන්වන එම ආයතනයට අනුබද්ධව කටයුතු කරන ඉතා පළපුරුදු සහ වෘත්තීය සුදුසුකම් ඇත්තා වූ උපදේශකවරු සහ කථිකාචාර්යවරුන්ගෙන් සමන්විත ගුරු මඬුල්ල වේ.

මෙම ආයතනයේ කාර්යක්ෂමතාවය සහ ප්‍රතිඵල තක්සේරු කලහැකි මිණුම් දණ්ඩ වනුයේ මෙහි පාඨමාලා හදාරා විශිෂ්ඨ දියුණුව ලැබූ ව්‍යාපාරිකයින්ගේ සාර්ථකත්වය, දැනට මෙහි පාඨමාලා හදාරණ අභ්‍යාසලාභීන්ගේ උද්‍යෝගය, උනන්දුව සහ මෙහි පුහුණුව ලැබීම සඳහා ඇතුලත්වීමට අයදුම්කරුවන් අතර ඇත්තා වූ මහත් තරගයද වේ.

වසර ගණනාවක් අප රටේ පැවති සංවෘත ආර්ථිකය යටතේ දක්ෂතා වර්ධනය සඳහා තිබූ ඉඩ ප්‍රස්ථා සීමාසහිත වූ බැවින් මෙම ක්ෂේත්‍රය තුල යටපත්ව තිබූ ජාත්‍යන්තර මට්ටමේ තරගකාරීත්වයට අවශ්‍ය කාර්මික ශිල්ප කළමණාකරණ ශක්තිය සහ වෘත්තීය දක්ෂතා වර්ධනය කිරීම සඳහා මෙම ආයතනය මහත් රුකුලක් වශයෙන් ආරම්භයේදී පිළිගනු ලැබීය.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් විවිධ අංශයන්හි විශේෂ දැනුම සහ පුහුණුව ලබාදීම සඳහා පාඨමාලා කිහිපයක් සකස් කර ඇති අතර එමගින් මුද්‍රණ කළමණාකරණය පිළිබඳ පිළිගත් ඩිප්ලෝමාවක් දක්වා හැදෑරිය හැකිය.

SLIOP යනුවෙන් කෙටියෙන් හැඳින්වෙන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය අනුමත පුණ්‍යායතනයකි. එබැවින් එය වෙත දෙනු ලබන පරිත්‍යාග අයබදු ගෙවීමෙන් නිදහස් කර ඇත. ලාභ නොලබන සංවිධානයක් වන මෙය එහි දියුණුව සහ අරමුණු ව්‍යාප්ත කිරීම සඳහා මෙම කර්මාන්තයේ නිරත ව්‍යාපාරික ප්‍රජාවන්ගෙන් සහ හිතවතුන්ගෙන් සහාය අපේක්ෂා කරන්නීය.

මේ සම්බන්ධයෙන් මේ දක්වා අපට ආධාර කළ HEIDELBERG, DRUCK MACHINE AG, AGFA GEVAERT, APPLE MACINTOSH යන සංවිධාන ඇතුලු සෙසු අයට අපගේ ඉමහත් ප්‍රසාදය පුද වේ. තවද අපගේ වත්මන් සේවාවන් වඩාත් දියුණු කිරීම සඳහා නූතන යන්ත්‍රෝපකරණ අවශ්‍යව ඇති බැවින් ඒවා ලබාගැනීමට ඔබගේ පූර්ණ සහය ගෞරවයෙන් අපේක්ෂා කරන්නෙමු.

මෙම ක්ෂේත්‍රයේ විවිධ අංශයන් පිළිබඳව මෙහි දෙනු ලබන පුහුණුව තුළින් ලබාගන්නා වූ දැනුම එම ක්ෂේත්‍රයේ රැකියාවන් වලට අත්වැලක් වනු ඇත. මෙම ආයතනයෙන් සපයනු ලබන දැනුම සහ උසස් තාක්ෂණය තුලින් මුද්‍රණ කර්මාන්තයේ නිරත අයහට තම දේශීය මුද්‍රණ කටයුතු ප්‍රමිතියෙන් සහ තත්ත්වයෙන් ඉතා උසස් මට්ටමකට ගෙන ඒමට හැකිවනු ඇත.

අභ්‍යාසලාභීන්ගේ දැනුම සහ හැකියාවන් දියුණු කිරීම සඳහා මෙම ආයතනයට වෘත්තීය මුද්‍රණ ශිල්පීන් ගණනාවකගේ සේවය ලබාගැනීමට හැකිවීම භාග්‍යයකි. මෙහි පාඨමාලාවන් සහ විෂය මාලාවන් පිළියෙල කිරීමද, අධ්‍යයන සැසිවාර මෙහෙයවීම සඳහා ද ඔවුන් සෘජුව සහභාගි වීම නිසා මෙම ආයතනයේ විවිධ අංශයන් බලාපොරොත්තු වන මට්ටමේ උසස් තත්ත්වයක පවත්වාගෙන යාමට හැකි වී තිබේ.

මුද්‍රණ ශිල්පයට අදාලව ඉතා උසස් තලයේ පුස්තකාලයක් ද මෙම ආයතනය සතුව ඇත. එමගින් න්‍යායික සහ ප්‍රායෝගික දැනුම ඉතා ගැඹුරින් හැදෑරීම සඳහා අභ්‍යාසලාභීන්ට අවස්ථාව ලැබී ඇත.

දැක්ම සහ ආකල්ප

පොදුවේ (හැඳින්වීම)

සෑම මානව ක්‍රියාකාරකමක් සඳහාම මුද්‍රණ කලාව පදනම් වී ඇති බව පැවසුවහොත් එය ඉතා නිවැරදිය. එසේම, මෙම ක්ෂේත්‍රය සෑමවිටම වෙනස්වන තොරතුරු තාක්ෂණය සමඟ තාක්ෂණිකමය වෙනස්වීම් වලට භාජනය වෙමින්, වර්තමානයේ සහ අනාගතයේ පවත්නා ඉල්ලුම සඳහා විශාල දියුණුවක් කරා ගමන් කරමින් තිබේ. තවද මෙම ක්ෂේත්‍රය තුළ වේගවත්ව සිදුවන ශිල්පීය ක්‍රමවේදයන්ගේ වෙස්වීම්, වඩා වැදගත් වන්නේ, ඊට අනුකූලව ජාත්‍යන්තර වෙළඳපොලේ ඉල්ලුමට ගැලපෙන පරිදි, රට තුළ වෙළඳ සහ කාර්මික පදනම නැවත සකස්වීමේ ක්‍රියාවලියක සිටින බැවිනි. එසේම මෙම ආයතනය විසින්, ඇසුරුම්කරණය, මුද්‍රණ සහ ප්‍රමිතිකරණය යන ක්ෂේත්‍ර තුළ පවත්නා නව අභියෝග සහ අවශ්‍යතා බොහෝ දුරට හඳුනාගෙන තිබේ.

ජාතික නිෂ්පාදන ඵලදායිතාවෙන් සහ ප්‍රමිතියෙන් උසස් තත්ත්වයකට ගෙන ඒමේ රජයේ වැඩපිළිවෙලට ආධාරකයක් වශයෙන්, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින්, කළමනාකරණ සහ අධීක්ෂණ නිලධාරීන් සඳහා කෙටිකාලීන පාඨමාලාවන් සකස්කර ක්‍රියාත්මක කරමින් පවතී. ඒ තුළින් ඔවුන්ගේ දැනුම සහ ශිල්පීය හැකියාව වර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. නිෂ්පාදන ඵලදායිතාව සහ ප්‍රමිතිය යන්න වෙන්කළ නොහැකි මූලධර්මයන් දෙකක් වේ.

තවද ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටුවීම නිසා රට තුළට විදේශ ව්‍යවසායකයින් පැමිණීම, ඒ නිසා විදේශ ආයෝජන ගලා ඒම, නව තාක්ෂණික ශිල්පීය ඥානය සහ ව්‍යාපාරික ක්‍රමවේද භාවිතය, පෞද්ගලික අංශය දියුණු කිරීමට වැඩි අවධානයක් යොමු කිරීම වැනි කරුණු නිසා, මුද්‍රණ රටා ක්ෂේත්‍රයේ දියුණුවට මහා පිටුවහලක් ලැබී තිබේ. මේ අනුව පෙනී යන්නේ නව අභියෝගවලට සහ අවශ්‍යතාවන්ට, අප මුහුණ දෙන්නා වූ ස්වභාවය මත, මෙම කර්මාන්තයේ අඛණ්ඩ සාර්ථකත්වය රඳා පවතින බවය.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මේ ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන නව තාක්ෂණික දියුණුවත් සමඟම එහි පවත්නා සම්පත්වල සහ පුහුණු පාඨමාලාවල තත්ත්වය උසස් කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාදාමයක යෙදී සිටියි. තවද මෙම ආයතනය පාසැල් හැරගිය අයවළුන් සඳහා වෘත්තීය පුහුණු අධිකාරියේ මුද්‍රණ පාසල සමඟ එක්ව පවත්වනු ලබන CPtronic Heidlberg Printing Machine භාවිතය පිළිබඳ විශේෂ පාඨමාලාව සහ TWO Colour Stream Feeder Litho Machine Operations පුහුණු පාඨමාලාව, හේතුවෙන්, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පුහුණු පාඨමාලා සඳහා වැඩි වටිනාකමක් ලැබී තිබේ.

එසේම ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය කොළඹ විශ්වවිද්‍යාලය හා එක්ව මුද්‍රණ තාක්ෂණ සහ කළමනාකරණය, දෘශ්‍ය සන්නිවේදනය සහ කළමනාකරණය යන උසස් ඩිප්ලෝමා පාඨමාලා දෙක පවත්වාගෙන යාමට හැකිවීම, මෙම ආයතනය ලැබූ විශාල ජයග්‍රහණයක් සේ සැලකිය හැක. තවද, කොළඹ විශ්වවිද්‍යාලයේ එම් පාඨමාලාව සඳහා, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ උසස් ඩිප්ලෝමාව හදාරා තිබීම මූලික සුදුසුකමක් ලෙස සැලකීම, ආයතනය ලැබූ ඉහළ පිළිගැනීමකි.

ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තය හොඳින් ස්ථාපනය වෙමින් පවතින අතර, එමනිසා මුද්‍රණ තත්ත්වය ක්‍රමවත්ව දියුණු වීම අවශ්‍යය වේ. ඊට අමතරව වර්තමානයේ, විද්‍යුත් පෙර-මුද්‍රණ ක්‍රියාදමයන් සමඟ මුද්‍රණ කර්මාන්තයේ ක්‍රියාකරකම් නවීකරණය වෙමින් පවතී. එසේම ශ්‍රී ලංකාව, මුද්‍රණයේ තත්ත්වය ආරක්ෂා කරගනිමින්, විද්ශීය තරඟවලට අතුළුවීම තුළ, ඒ මගින් ලබාගන්නාවූ අවබෝධය සහ විශේෂඥතාවය මුද්‍රණ කර්මාන්තයේ දියුණුව සඳහා වැදගත් වේ.

වර්තමානයේදී, ශ්‍රී ලංකාවේ මුද්‍රණ රටා ක්ෂේත්‍රයේ විවිධ අංශයන් ගැන උසස් අධ්‍යාපනයක් ලබා දිය හැකි එකම ආයතනය, ශ්‍රී.ලං.මු.ආ. වේ. එසේම මෙම ආයතනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ යන්ත්‍ර උපකරණ ලබාදෙන්නේ නම්, මෙම කර්මාන්තය සඳහා අවශ්‍ය කරන සියලු පුහුණු පාඨමාලාවන් පැවැත්විය හැකිය. ඊට අමතරව මෙම කර්මානත්යේ තාක්ෂණිකමය ඉල්ලුම සපුරාලීමට අවශ්‍යය කරන ශිල්පීය ඥනය සහ ශිලපීය ක්‍රම පිළිබඳව, මුද්‍රණකරුවන්ට අවශ්‍ය පුහුණුව හා උපදෙස් ලබාදීමටද හැකිවේ. එසේම ආයතනයේ ඉඩප්‍රමාණය හා සම්පත් අතින් තවත් වැඩි දියුණු වූ විට ආයතනිකමය පරීක්ෂණ, මුද්‍රණ කඩදසි, තීන්ත පරීක්ෂණ සහ ප්‍රමිතිකරණය වැනි අමතර සේවාවන්ද අවශ්‍යකරන පාර්ශ්ව වෙත ලබාදියහැකිය.

ආයතනය අලුත් නවාතැනකට

ඉහත සඳහන් සියලු කාරණා සැලකිල්ලට ගැනීමේදී ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික්ස් ක්ෂේත්‍රය පුළුල් වීම තුළ, ශ්‍රී ලජකා මුද්‍රණ ආයතනයේ සේවාවන් තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා සියලු පහසුකම් සහිත තාක්ෂණික පුහුනු ආයතනයක් ගොඩනැගීම අවශ්‍ය වී ඇත. එසේම මුද්‍රණ ආයතනයේ ඇති අඩු ඉඩකඩ සහ පහසුකම් නිසා ඇතිවන බාධා පාලනාධිකාරිය විසින් හොඳින් හඳුනාගෙන ඇති අතර, ඒ සඳහා රජය සමඟ සියලු පහසුකම් සහිත පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමට මාර්ගය සකස් කරගෙන තිබේත

මේ සඳහා පර්චස් 40ක ඉඩමක්, රජයේ මුද්‍රණාල පරිශ්‍රයෙන් ලැබී ඇති අතර, එම පුහුණු මධ්‍යස්ථානය ගොඩනැගීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබාගැනීමට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය උත්සාහ ගනිමින් සිටී.

පාලන අධිකාරිය - ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ජී.කේ.ඩී.ලියනගේ මිය	-	රජයේ මුද්‍රණාලයාධිපති / සභාපති
ජනක රත්නකුමාර මයා	-	සභාපති-රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව / සාමාජික
ඩිලාන් සිල්වා මයා	-	සභාපති-ශ්‍රී ලංකා මුද්‍රණ කරුවන්ගේ සංගමය / සාමාජික
අනුරාධ ජයසිංහ මයා	-	සභාපති-ශ්‍රී ලංකා ඇසුරුම්කරුවන්ගේ සංගමය / සාමාජික
මේනක ප්‍රනාන්දු මයා	-	සාමාජික
කපිල නන්ද කුමාර මයා	-	සාමාජික
යසීන්ද්‍ර අබේවික්‍රම මයා	-	සාමාජික
තුසිත ගුණවර්ධන මයා	-	සාමාජික

කාර්ය මණ්ඩලය - ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

සිසිර බරනගේ මහතා	-	ලේඛකාධිකාරී / ප්‍රධාන විධායක නිළධාරී
හිමාෂි ෆොන්සේකා මහත්මිය	-	පාලන හා ගිණුම් සහකාර
තනුජා දමයන්ති මහත්මිය	-	සහකාර කථිකාචාර්ය
චමල් හෙට්ටිආරච්චි මහතා	-	සහකාර කථිකාචාර්ය
සමන්ත කුලතුංග මහතා	-	උපදේශක
අමිල වන්නිආරච්චි මහතා	-	උපදේශක
ඩබ්.ජ්.එම්.ලංකාතිලක මහතා	-	කළමණාකරන සහකාර
යාපා දහනායක මහතා	-	කාර්යාල කාර්ය සහායක

පරිපාලන සැකිල්ල



අනුමත කාර්ය මණ්ඩලය

ලේඛකාධිකාරි	- 01
පාඨමාලා අධ්‍යක්ෂ	- 01
සහකාර කථිකාචාර්ය	- 02
උපදේශකවරු	- 07
ගිණුම් හාපරිපාලන නිලධාරී	- 01
ලිපිකරු	- 01
කර්යාල කාර්ය සහායක	- 01

වර්තමාන කාර්ය මණ්ඩලය

ලේඛකාධිකාරි	- 01
පාඨමාලා අධ්‍යක්ෂ	- 01
සහකාර කථිකාචාර්ය	- 02
උපදේශකවරු	- 05
ගිණුම් හාපරිපාලන නිලධාරී	- 01
ලිපිකරු	- 01
කර්යාල කාර්ය සහායක	- 01

බාහිර කථිකාචාර්ය මඬුල්ල

ආචාර්ය ඒ.ඒ.සී.අබේසිංහ මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
රුවනී චන්ද්‍රසේකර මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
චන්දන විජේකෝන් මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
ජී.ආර්.ටී.සිල්වා මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
එස්.සසිදරන් මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
ඒ.එච්.සී.පී.අතපත්තු මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
ගුණපාල රණවීරගේ මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය සම්පත් කෙහෙල්වලතැන්න මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
නුරාදි ජයසිරි මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
ඒ.ඩබ්.ජේ.සී.අබේගුණසේකර මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
ගිම්හානී ඒකනායක මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
රොෂෙල් විමලසිංහ මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
කේ.ඩී.ජේ.සමන්ති මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
කාංචනා විජයවර්ධන මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය රාජිත සිල්වා මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය ආර්.සෙන්තිරාජා මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය කේ.කජේන්ද්‍ර මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
ශානිකා ලක්මාලි මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
රුවන්ගි චන්ද්‍රසේකර මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
අශෝක නානායක්කාර මහතා	-	උපදේශක ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ගංගානී ලියනගේ මහත්මිය	-	රජයේ මුද්‍රණාලාධිපති සහ සභාපති ශ්‍රී.ලං.මු.ආ.
රසන්ත චන්ද්‍රතිලක මහතා	-	මුද්‍රණ උපදේශක
රෙව්.ඩී.බිලින් මහතා	-	නිර්මාණ උපදේශක
ජගත් මදනායක මහතා	-	වෙළඳ කළමනාකරු,ඩී.අයි.සී.ලංකා පුද්. සමාගම
සිසිර බරණගේ මහතා	-	ප්‍රධාන විධායක නිළධාරී ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
ස්ටැන්ලි හෙට්ටිආරච්චි මහතා	-	අධ්‍යක්ෂ වෘත්තීය හා තාක්ෂණික විශ්ව විද්‍යාලය කථිකාචාර්‍ය හා උපදේශක සිනමාකරණය
ඔස්මන් ජයා මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලේක්හවුස් ආයතනය
රොහාන් පියරත්න මහතා	-	උපදේශක ග්‍රැපික් නිර්මාණකරණය
ප්‍රසන්න ජයරත්න මහතා	-	උපදේශක ග්‍රැපික් නිර්මාණකරණය
ජේ.ජී.නයෝමි නිරංගා මෙනෙවිය	-	උපදේශක ග්‍රැපික් නිර්මාණකරණය
ජේ.ඒ.ඩී.ප්‍රේමතුංග මහතා	-	කථිකාචාර්ය පොත් බැදුම්කරණය සහ නිමාව
ඩබ්.එස්.ප්‍රියන්ත මහතා	-	කථිකාචාර්ය මුද්‍රණ පිරිවැයකරණය
ධම්මික විමලරත්න මහතා	-	කථිකාචාර්ය මුද්‍රණ තාක්ෂණය
එම්.එම්.ඩී.ලක්මාල් පෙරේරා මහතා	-	කථිකාචාර්ය වෙබ් අඩවි නිර්මාණකරණය හා Ms Office
නීල් කුරේ	-	කථිකාචාර්ය ඩිජිටල් ඇනිමේෂන් තාක්ෂණය

ශාඛාවන්

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සතුව ශාඛාවක් මාතලේ පවත්වාගෙන යනු ලැබේ.

ලිපිනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මාතලේ
දුරකථන: 0662222172

මාතලේ ශාඛාවේ පවත්වනු ලබන පාඨමාලාවන් පහත දැක්වේ

1. පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම
2. පරිගණක මුද්‍රණ රටා
3. මයික්‍රොසොෆ්ට් ඔෆීස්
4. වෙබ් ඩිසයිනින්

පුහුණු පාඨමාලා - 2020

පාඨමාලාව	පාඨමාලා කාලය	පාඨමාලා ගාස්තුව
ග්‍රැෆික් ඩිසයින් ඩිප්ලෝමා පාඨමාලාව	අවුරුදු 01	රු.40,250/-
වෙබ් අඩවි නිර්මාණය පිළිබද ඩිප්ලෝමා පාඨමාලාව	අවුරුදු 01	රු.40,000/-
පරිගණක ආශ්‍රිත මුද්‍රණ රටා (NVQ) පාඨමාලාව	පැය115	රු.23,250/-
පරිගණක ආශ්‍රිත මුද්‍රණ රටා (SLIOP) පාඨමාලාව	පැය114	රු.17,750/-
පරිගනක ආශ්‍රිත අකුරු ඇමිනීම පිළිබද පාඨමාලාව	පැය120	රු.13,750/-
මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබද පාඨමාලාව	සති 20	රු.13,250/-
පිරිවැය හා ඇස්තමේන්තුකරණය පිළිබද පාඨමාලාව	වසර 01	රු.20,750/-
පත් ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබද පාඨමාලාව	සති 26	රු.20,750/-
පොත් බැදුම්කරණය හා නිමාව පිළිබද පාඨමාලාව	සති 28	රු.23,250/-
වෙබ් අඩවි නිර්මාණය පිළිබද පාඨමාලාව	සති 20	රු.16,750/-
ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබද පූර්ණ කාලීන පාඨමාලාව	මාස 14	රු.22,750/-
අරේකීය සජීවීකරනය පිළිබද පාඨමාලාව	සති 16	රු.23,250/-
ආංකීය සජීවී කරණය පිළිබද පාඨමාලාව	සති 24	රු.23,750/-
දෘඩාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබද පාඨමාලාව	සති 14	රු.12,750/-
සිව් වර්ණ මුද්‍රණය පිළිබද පාඨමාලාව	සති 12	රු.25,000/-

2020 වසරේ පැවැත්වූ වැඩමුලු හා සම්මන්ත්‍රණ

	සම්මන්ත්‍රණය	දිනය	සහභාගීත්වය
1.	පොත්බැඳුම් කරණය	2020.01.09	53
2.	පරිගණක මුද්‍රණ රටා	2020.01.14	11
3.	පරිගණක මුද්‍රණ රටා	2020.09.17	19

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
Sri Lanka Institute of Printing
ESTABLISHED BY AN ACT OF PARLIAMENT IN 1984

CAREER DEVELOPMENT PATH



Sri Lanka Institute of Printing
No. 118, Dr. Danister De Silva Mawatha, Colombo 08
sliopreg@sltnet.lk
www.sliop.edu.lk
0112 686162, 0112 679791
0112 686162

SLIOP/ACD/DO/10 DOI:02-01-2014 REV:00 ISSUE NO:01

ශිෂ්‍ය දත්ත - 2020

පාඨමාලාව	ඉලක්ක සිසුන් ගණන	සත්‍ය සිසුන් ගණන
ග්‍රැෆික් ඩිසයින් ඩිප්ලෝමා පාඨමාලාව	72	36
මුද්‍රණ හා ග්‍රැපික්ස් ආට්ස් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	-	58
වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	-	11
පරිගණක ආශ්‍රිත මුද්‍රණ රටා පාඨමාලාව	300	245
පරිගනක ආශ්‍රිත අකුරු ඇමිනීම පිළිබඳ පාඨමාලාව	75	24
මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	60	103
පොත් බැඳුම්කරණය හා නිමාව පිළිබඳ පාඨමාලාව	50	26
දත්ත සහ සන්නිවේදනය පිළිබඳ පාඨමාලාව	-	10
ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ පූර්ණ කාලීන පාඨමාලාව	40	22
ආංකීය සජීවීකරනය පිළිබඳ පාඨමාලාව	12	14
අරේකීය සංස්කරණය පිළිබඳ පාඨමාලාව	12	23
පරිගණක දෘඩාංග සහ එකලස් කිරීම පිළිබඳ පාඨමාලාව	10	10

මූල්‍ය දත්ත - 2020

ප්‍රධාන කාර්යාලය	ඇස්තමේන්තුගත ආදායම සහ වියදම	තථ්‍ය ආදායම සහ වියදම
මෙහෙයුම් ආදායම් මෙහෙයුම් නොවන ආදායම්	රු.21,069,000.00 රු. 9,657,634.00	රු. 19,654,609.00 රු. 9,617,306.00
ආදායම් වල එකතුව වියදම් මෙහෙයුම් ලාභය/අලාභය	රු. 30,726,634.00 රු. 19,690,370.00 රු. 1,378,630.00 රු. 11,036,264.00	රු. 29,271,915.00 රු. 24,400,616.00 (රු. 4,746,007.00) රු. 4,871,299.00
මාතලේ ශාඛාව	**ඇස්තමේන්තු ගත ආදායම/වියදම**	**තථ්‍ය ආදායම සහ වියදම**
ආදායම වියදම ලාභය/අලාභය	රු. 810,000.00 රු. 677,206.00 රු. 132,794.00	රු. 533,750.00 රු. 744,038.50 රු. (210,288.50)

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් වාර්තා

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
නො. 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත කොළඹ 8.
විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	2020 රු.	2019 රු.
පාඨමාලා ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ අනෙකුත් මෙහෙයුම් ආදායම්	1	12,848,041.00	30,241,851
මාතලේ ශාඛාවෙන් ලද ශුද්ධ අතිරික්තය/(ඌණතාවය)	2	(210,288.50)	116,647
පාඨමාලා ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් මත සෘජු වියදම්	3	(6,223,638.29)	(12,902,820)
සේවක වියදම් හා මෙහෙයුම් පිරිවැයට පෙර ආදායම		**6,414,114.21**	**17,455,677**
අනෙකුත් ආදායම්	4	6,806,568.10	2,201,642
මෙහෙයුම් ආදායම		**13,220,682.31**	**19,657,319**
මෙහෙයුම් වියදම්			
සේවක වියදම්	5	(4,116,559.47)	(5,174,438)
දේපල උපකරණ හා ක්‍රමක්ෂය	6	(8,108,063.39)	(3,565,383)
අනෙකුත් මෙහෙයුම් වියදම්	7	(5,742,067.84)	(5,427,956)
මුළු මෙහෙයුම් වියදම්වල එකතුව		**(17,966,690.70)**	**(14,167,777)**
ශුද්ධ මෙහෙයුම් ආදායම		**(4,746,008.39)**	**5,489,542**
ශුද්ධ මූල්‍ය ආදායම	8	9,617,306.71	9,219,820
වර්ෂයේ අතිරික්තය		**4,871,298.33**	**14,709,362**
අනෙකුත් විස්තරාත්මක ආදායම්		-	-
වර්ෂයට අදාල විස්තරාත්මක ආදායම සමුච්චිත අරමුදලට මාරු කළා		**4,871,298.33**	**14,709,362**

මෙම මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 17 දක්වා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
නො. 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 8.
මූල්‍ය තත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට	සටහන්	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	9	63,104,869.20	71,086,532
අස්පෘෂ්‍ය වත්කම්	10	-	-
මුළු ජංගම නොවන වත්කම්		**63,104,869.20**	**71,086,532**
ජංගම වත්කම්			
වෙළඳ හා අනෙකුත් ලැබීම්	11	4,490,109.49	6,159,101
අත්තිකාරම් හා කලින් කල ගෙවීම්	12	18,768.06	690,505
කෙටිකාලීන ආයෝජන	13	112,120,105.16	102,531,212
මුදල් හා මුදල් වලට සමාන දෑ	14	3,193,551.89	5,786,504
මුළු ජංගම වත්කම්		**119,822,534.60**	**115,167,322**
මුළු වත්කම්		**182,927,403.80**	**186,253,854**
අරමුදල් සහ වගකීම්			
අරමුදල්			
සමුච්චිත අරමුදල	15	119,440,543.37	114,569,245
මුළු අරමුදල්		**119,440,543.37**	**114,569,245**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික වෙන්කිරීම්	16	1,917,920.00	1,595,960
ආධාර ලැබීම්	17	59,557,470.88	66,364,039
මුළු ජංගම නොවන වගකීම්		**61,475,390.88**	**67,959,999**
ජංගම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ගෙවීම්	18	2,011,469.55	3,724,609
මුළු ජංගම වගකීම්		**2,011,469.55**	**3,724,609**
මුළු අරමුදල් සහ වගකීම්		**182,927,403.80**	**186,253,854**

මෙම මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 17 දක්වා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
නො. 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත කොළඹ 8.
සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය

	සමුච්චිත අරමුදල	එකතුව
	රු.	රු.
2019/01/01 දිනට ශේෂය	**99,859,882.92**	**99,859,882.92**
වසරේ අතිරික්තය	14,709,362.12	14,709,362.12
2019/12/31 දිනට ශේෂය	**114,569,245.04**	**114,569,245.04**
වසරේ අතිරික්තය	4,871,298.33	4,871,298.33
2020/12/31 දිනට ශේෂය	**119,440,543.37**	**119,440,543.37**

මෙම මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 17 දක්වා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
නො. 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත කොළඹ 8.
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020	2019
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
වියදමට වැඩි ආදායම	4,871,298	14,709,362
ගැලපීම්		
ක්ෂයවීම් හා ක්‍රමක්ෂය	8,108,063	3,565,383
ආධාර ලැබීම්	(6,806,568)	(1,701,642)
පාරිතෝෂික වෙන්කිරීම්	321,960	342,624
පොළී ලැබීම්	(9,588,896)	(9,191,331)
ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	**(3,094,142)**	**7,724,396**
ණයගැතියන් හා අනෙකුත් ලැබීම්වල (වැඩිවීම්) / අඩුවීම්	2,340,729	(408,561)
ගෙවිය යුතු වියදම්වල (අඩුවීම්) / වැඩිවීම්	(1,713,140)	320,589
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(2,466,553)**	**7,636,424**
පාරිතෝෂික ගෙවීම්	-	(147,955)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(2,466,553)**	**7,488,469**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
පොළී ලැබීම්	10,432,365	7,689,906
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම	(126,401)	(1,597,732)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**10,305,964**	**6,092,175**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
ආධාර ලැබීම්	-	18,065,681
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**-**	**18,065,681**
මුදල් හා මුදල් වලට සමාන දෑ වලට සිදු වූ ශුද්ධ බලපෑම	7,839,411	31,646,324
පසුගිය වසරේ මුදල් හා මුදල් වලට සමාන දෑ	102,949,326	71,303,001
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ	**110,788,737**	**102,949,326**
මුදල් හා මුදල් වලට සමාන දෑ		
බැංකු මුදල්	3,193,516	5,781,433
කෙටිකාලීන ආයෝජන	107,595,185	97,162,822
අතැති මුදල්	36	5,071
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ	**110,788,737**	**102,949,326**

මෙම මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 17 දක්වා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1. ආයතනික තොරතුරු

1.1 පොදු

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය 1984 වර්ෂයේදී අංක 18 දරණ මුද්‍රණ ආයතන පනත යටතේ පිහිටුවා ඇත. ආයතනයේ ලියාපදංචි කාර්යාලය අංක 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 8 යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.2 මූලික කටයුතු හා මෙහෙයුම්වල ස්වාභවය

2012 වර්ෂයේදී මුද්‍රණ ආයතනය පහත සඳහන් කටයුතුවල යෙදී ඇත.

අ. මුද්‍රණ කටයුතු පිළිබඳ පාඨමාලා පැවැත්වීම

ආ. මුද්‍රණ කර්මාන්තයේ අළුත් තාක්ෂණ ක්‍රම පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම.

ඇ. මුද්‍රණ කටයුතු පිළිබඳ උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීම

ඈ. මුද්‍රණ කර්මාන්තයේ රැකියා සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම.

2. වැදගත් වන ගිණුම්කරණ ප්‍රමිතීන්

2.1 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

මුද්‍රණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඉදිරිපත්කර තිබේ.

මුද්‍රණ ආයතනයේ මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී මූල්‍ය වත්කම් හා වගකීම් සාධාරණ අගය මත ගිණුම් ගත කිරීම හැර ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

2.2 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

මුද්‍රණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් පනවා ඇති සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත.

2.3 භාවිතා කරන ලද වැදගත් ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනාගතයට අදාල වන ඉතා වැදගත් සමහර ගිණුම්කරණ උපකල්පන භාවිතා කිරීමට සිදුවේ. ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදී කළමනාකාරිත්වය විසින් පහත සඳහන් වැදගත් ගිණුම්කරණ විනිශ්චයක්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගෙන ඇත.

අඛණ්ඩ පැවැත්ම

සැලකිය යුතු අනාගත කාලයක් සඳහා මුද්‍රණ ආයතනය පවත්වාගෙන යාමට හැකි බවට කළමණාකාරිත්වය තක්සේරු කර ඇත. තවදුරටත් අඛණ්ඩ පැවැත්ම පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සැලකිය යුතු අනුමානයන් යොමු කල හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පිළිබඳ කළමනාකාරිත්වය නොදැන සිටින බවත් සහ මෙහෙයුම් කටයුතු ඇවර කිරීමට හෝ අවසන් කිරීමට ඔවුන්ට අදහසක් නොමැති බවය.

මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් සාධාරණ අගය මත දක්වා ඇත. සාධාරණ අගය තීරණය කිරීමට වෙළඳපොළ මිල ගණන් සොයා ගත නොහැකි විට ඒ සඳහා අනෙකුත් අගය කිරීම් ක්‍රම උපයෝගී කර ගනී.

2.4 මූල්‍ය උපකරණ ආරම්භක හඳුනා ගැනීම සහ පසු අගය කිරීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 11,12 සහ 11.41 ට අයත් විෂය පථය යටතේ මූල්‍ය උපකරණ වර්ග කර ඇත. මූල්‍ය වත්කමක ආරම්භය හඳුනාගැනීමේදී මුද්‍රණ ආයතනය වර්ගීකරණය කරනු ලබයි.

2.4.1 හඳුනා ගැනීමේ දිනය

සියළුම මූල්‍ය වත්කම් හා වගකීම් ගනුදෙනුව සිදු වූ දිනයේදී හඳුනා ගැනේ.

2.4.2 මූල්‍ය උපකරණවල ආරම්භක අගය කිරීම

ආරම්භක හඳුනාගැනීමේදී මූල්‍ය උපකරණ වර්ග කිරීම ඒවායේ පරමාර්ථය, ගති ලක්ෂණ සහ ඒවා අත්පත් කර ගැනීමේදී කළමනාකරුවන්ගේ අභිප්‍රාය මත රඳා පවතී.

2.4.3 මූල්‍ය උපකරණ වල පසු අගය කිරීම

මුද්‍රණ ආයතනය මුල් අගය කිරීමෙන් පසුව සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම මූල්‍ය උපකරණ වල ගනු දෙනු මිල හා සාධාරණ අගයෙහි වෙනසස්වීම් හඳුනා ගනී.

2.5 මූල්‍ය උපකරණ හඳුනා නොගැනීම

2.5.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමක් (මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් වල කොටසක් යම් තැනක අදාළ වන පරිදි) පහත සඳහන් අවස්ථාවල හඳුනා නොගනී.

- වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය අවසන් වී තිබීම
- මුද්‍රණ ආයතනය විසින් වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය මාරු කර තිබීම.

2.5.2 මූල්‍ය වගකීම්

වගකීම් යටතේ වන බැඳීම් නිදහස් වූ විට හෝ අහෝසි වූ විට හෝ කාලය ඉකුත් වූ අවස්ථාවක මූල්‍ය වගකීම් හඳුනා නොගනු ලැබේ. තිබෙන මූල්‍ය වගකීමක් එම ණය හිමියාගේම වෙනත් මූල්‍ය වගකීමකින් සැලකිය යුතු වෙනත් කොන්දේසි යටතේ හෝ දැනට තිබෙන වගකීම්වල කොන්දේසි සැලකිය යුතු සංශෝධනය වීමක් යටතේ, ප්‍රතිෂ්ඨාපනය වූ අවස්ථාවක, එවැනි හුවමාරුවක් හෝ සංශෝධනයක් මුල් වගකීම හඳුනා නොගැනීමක් ලෙසත් සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙසත් සලකනු ලැබේ. මුල් මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ ගෙවන ලද ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභ හෝ අලාභ වල හඳුනා ගනු ලැබේ.

2.5.6 මූල්‍ය වත්කම්වල අපහායනය

සෑම වාර්තාකරණ දිනයකදීම මුද්‍රණ ආයතනය විසින් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අපහායනයට ලක් වී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි ඇති බවට සලකනු ලබන්නේ වත්කමක ආරම්භක හඳුනා ගැනීමෙන් පසු සිදු වී තිබෙන සිද්ධීන් එකක් හෝ කිහිපයක ප්‍රතිඵලයන් වශයෙන් (දරන ලද අලාභ සිද්ධියක්) අපහායනයට අදාළ විෂයානුබද්ධ සාක්ෂි ඇත්නම් සහ විශ්වාසවන්තව ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කම් වල සහ මූල්‍ය සමූහගත අනාගත මුදල් ප්‍රමාණවල බලපෑමක් කල හැකි අදාළ අලාභ සිද්ධිය (සිද්ධීන්) ඇති වී තිබෙන විටය.

2.6 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ දෛනික නඩත්තු වියදම් එකතු කිරීමක් නොමැතිව සමුච්චිත ක්ෂය වීම් සහ සමුච්චිත හානි වන අගය හීන වීම් අඩුකල පිරිවැය මත දැක්වේ.

වත්කමේ ඉතිරි ඵලදායී ජීවකාලය සහ අගය ක්ෂයවීම පිළිබඳ විධි ක්‍රම මූල්‍ය වර්ෂය අවසානයේදී විමර්ශනය කරනු ලබයි. ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ පිරිවැය මත සරල මාර්ග ක්ෂය ක්‍රමයටය. ක්ෂය වීමට අදාළ අනුපාත පහත දැක්වේ.

පරිගණක	අවුරුදු 3
යන්ත්‍ර හා අනෙකුත්	අවුරුදු 10

විකිණීමේදී හෝ දේපල,පිරියත හා උපකරණ භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ බලාපොරොත්තු නොවන අවස්ථාවක ඒවා හඳුනා නොගනු ලැබේ. එවැනි අවස්ථාවකදී සිදුවන ලාභ හෝ අලාභ (වත්කමේ වත්මන් අගය ලෙස ගෙන යන ප්‍රමාණය සහ එය විකිණීමේදී ලද ශුද්ධ ආදායම අතර ගණනය කරන ලද වෙනස) එකී වත්කම මුළුමනින්ම නොසලකා හරින ලද වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් තුල ඇතුලත් කරනු ලැබේ.

2.7 වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයන්

වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයන් ගනුදෙනුව සිදුවූ මිලට හඳුනා ගනු ලැබේ. එම ශේෂයන් සඵලදායී පොළී අනුපාතය යටතේ පසුකාලීනව අගය කරනු ලැබේ.

2.8 රාජ්‍ය ප්‍රදාන

රාජ්‍ය ප්‍රදාන ලැබීමේ සියළු අවශ්‍යතා සපුරාලු විට එම වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කරයි.

2.8 සේවක ප්‍රතිලාභ වගකීම්

2.8.1 සේවක අර්ථසාධක අරමුදල/සේවක භාරකාර අරමුදල

සේවකයින් සහ මුද්‍රණ ආයතනය සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල අනුමත කරන ලද අනුප්‍රමාණයන්ගෙන් දායක වනු ලැබේ.

2.8.2 විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම්

පාරිතෝෂික වෙන්කිරීම් සඳහා ව්‍යාපෘති ඒකක බැර (Projected Unit Credit) ක්‍රමය සරල කර යොදා ගෙන ඇත.

2.9 වෙන්කිරීම්

වගකීම් පිළිබඳ සත්‍ය ඇස්තමේන්තුවක් කළ හැකි සහ එම වගකීම් පියවීම් සඳහා ආර්ථික ප්‍රතිලාභවලින් සමන්විත සම්පත් බැහැර යාමක් සිදුවේයයි නිශ්චිත අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ ආනයනය සතු වගකීමක් (නීතිමය හෝ වටහා ගත හැකි) ඇති විට අදාළ වෙන් කිරීම හඳුනා ගනී.

2.10 ගෙවිය යුතු ශේෂය

ගෙවිය යුතු ශේෂය ගනුදෙනුව සිදු වූ මිලට මූලිකව හඳුනාගනු ලැබේ. එම ශේෂයන් සඵලදායී පොළී අනුපාතය යටතේ පසුකාලීනව අගය කරනු ලබයි.

2.11 මුදල් සහ මුදල් වලට සමාන දෑ

මුදල් සහ මුදල් වලට සමාන දෑ සමන්විත වනුයේ ඇතැති මුදල්, බැංකු සමග ශේෂයන්, ඉල්ලුම් තැන්පතු සහ ව්‍යවහාර මුදල් බවට ඉක්මනින් පරිවර්තනය කළ හැකි වූ දළ වටිනාකම වෙනස්වීම පිළිබඳ සැලකිය යුතු අවධානමක් නොමැති වූ ද කෙටි කාලීන හා අධික ද්‍රවශීලතා තත්වයන්, පවත්නා ආයෝජන වේ.

2.12 ආදායම් හඳුනා ගැනීම

අනාගත ආර්ථික ලාභ ආයතනයට ගලා එන බවට සම්භාවිතාවන් ඇත්නම් සහ ආදායම් විශ්වාසනීය ලෙස අගය කල හැකි තරමට පමණක් ආදායම් හඳුනා ගනු ලැබේ.

සේවා සැපයීම

සේවා සැපයීමට අදාළ ආදායම සේවාව සැපයූ කාල පරිච්ඡේදයේදී හඳුනා ගනු ලැබේ.

පොලී ආදායම

පොලී ආදායම සඵල පොලී අනුපාතිකය භාවිතා කරමින් වාර්තා කරනු ලැබේ,

2.13 වියදම් හඳුනා ගැනීම

ආදායම ඉපයීමට අදාල සියළු වියදම් එම ආදායමට එරෙහිව කපා වර්ෂය තුල ගිණුම්ගත කර ඇත. ආයතනය පවත්වාගෙන යාමට අදාළ සියළු වියදම් හා දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාමට අදාළ වියදම් ලාභයට එරෙහිව වර්ෂය තුලදී ගිණුම්ගත කර ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020	2019
	රු.	රු.

1 පාඨමාලා ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ අනෙකුත් මෙහෙයුම් ආදායම්

	2020 රු.	2019 රු.
පාඨමාලා ගාස්තු	12,541,275.00	29,299,551
ලියාපදිංචි ගාස්තු	298,766.00	481,000
විභාග ගාස්තු	8,000.00	31,500
සම්මාන උළෙල සඳහා ගාස්තු	-	429,800
	12,848,041.00	**30,241,851**

2 ශුද්ධ අතිරික්තය / (ඌණතාවය) - මාතලේ ශාඛාව

	2020 රු.	2019 රු.
ආදායම්		
පාඨමාලා ගාස්තු	533,750.00	817,500
වියදම්		
සේවක වේතන හා ප්‍රසාද දීමනා	517,319.60	493,140
සේවක අර්ථසාධක අරමුදල	47,966.40	40,218
සේවක භාරකාර අරමුදල	11,991.60	10,055
ප්‍රායෝගික පරීක්ෂණ ගාස්තු	-	23,400
විදුලිය	16,826.60	9,052
දුරකථන	7,527.30	7,783
අපහායනය සඳහා වෙන් කිරීම්	96,000.00	72,500
පාරිතෝෂික වෙන් කිරීම්	46,407.00	44,706
	744,038.50	**700,853**
වියදමට වැඩි ආදායම / (ආදායමට වැඩි වියදම)	**(210,288.50)**	**116,647**

<u>ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය</u>
<u>මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්</u>

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020	2019
	රු.	රු.
3 පාඨමාලා ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් මත සෘජු වියදම්		
කාර්ය මණ්ඩල වැටුප් ප්‍රසාද දීමනා හා අතිකාල දීමනා	2,117,489.60	3,044,972
සේවක අර්ථසාධක අරමුදල	186,715.00	261,947
සේවක භාරකාර අරමුදල	46,678.80	65,747
දේශන ගාස්තු හා ඒකාබද්ධ අරමුදලට ගෙවීම්	1,545,305.00	3,713,400
ප්‍රායෝගික ගාස්තු හා ඒකාබද්ධ අරමුදලට ගෙවීම්	776,927.50	1,812,518
උසස් ඩිප්ලෝමා වැඩ සටහන සඳහා - ගරු දීමනා	66,000.00	-
සම්බන්ධීකරණ ගාස්තු - (NVQ Print & Graphic Art Technology)	144,000.00	170,000
තොරතුරු තාක්ෂණ උපකරණ නඩත්තු	66,000.00	60,000
සම්මන්ත්‍රණ වියදම්	4,800.00	900
ඡායා පිටපත් වියදම්	147,650.39	255,521
ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අමුද්‍රව්‍ය	44,520.00	85,044
ලිපිද්‍රව්‍ය හා මුද්දර	53,752.00	104,178
කුළී, විදුලිය හා ජලය	311,250.00	391,500
දේශන ගාස්තු - කොළඹ විශ්ව විද්‍යාලය	672,000.00	672,000
NVQ - වියදම්	13,200.00	34,888
පරීක්ෂණ වියදම් - NVQ - වැඩසටහන	-	180,000
පුහුණු වැඩ සටහන් සඳහා ගිය වියදම්	16,500.00	416,270
විභාග අධීක්ෂණ වියදම්	10,850.00	52,150
ප්‍රශ්න පත්‍ර පරීක්ෂණ වියදම්	-	6,000
සම්මාන උළෙල සඳහා වියදම්	-	1,575,786
	6,223,638.29	**12,902,820**
4 <u>අනෙකුත් ආදායම</u>		
සේවක පුහුණු වැඩ සටහන් සඳහා ආධාර ලැබීම්	-	500,000
බැර ශේෂයන් කපා හැරීම	6,806,568.10	1,701,642
	6,806,568.10	**2,201,642**
5 <u>සේවක වියදම්</u>		
කාර්ය මණ්ඩල වැටුප්, ප්‍රසාද දීමනා, අතිකාල හා දීමනා	3,273,296.71	3,205,468
සේවක අර්ථසාධක අරමුදල	282,048.00	231,158
සේවක භාරකාර අරමුදල	70,512.00	57,529
කම්කරු වියදම් හා කාර්යාල කාර්ය සහායක දීමනා	-	129,500
සුභසාධන වියදම්	103,649.76	193,573
සේවක පුහුණු වියදම්	111,500.00	1,059,292
පාරිතෝෂික වෙන්කිරීම්	275,553.00	297,919
	4,116,559.47	**5,174,438**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020	2019
	රු.	රු.

6 දේපල උපකරණ හා ක්‍රමක්ෂය

	8,108,063.39	3,562,412
ක්ෂයවීම්	-	2,971
ක්‍රමක්ෂය		
	8,108,063.39	**3,565,383**

7 අනෙකුත් මෙහෙයුම් වියදම්

සභාපතිට දීමනා	420,000.00	360,000
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීමේ දීමනා	114,000.00	-
තත්ව සහතික වියදම්	-	396,495
ගමන් ගාස්තු	7,775.00	12,760
ගමන් ගාස්තු - උපදේශකවරුන් සඳහා	50,000.00	-
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම	14,520.00	-
යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා හා නඩත්තු වියදම්	194,025.00	688,257
දුරකථන	52,921.84	83,568
අන්තර්ජාල සේවා ගාස්තු	102,860.88	90,116
ගිණුම්කරණ වියදම් සහ අනිකුත් වෘත්තීමය වියදම්	267,120.00	269,580
විගණන ගාස්තු	262,200.00	262,200
ප්‍රචාරක වියදම්	338,052.12	1,210,716
SLIOP ශාක්‍යතා වාර්තාව සහ ඉදිරිපත් කරන වාර්තාව සඳහා ගිය වියදම්	175,000.00	-
අපහායනය සඳහා වෙන් කිරීම්	3,550,250.00	1,621,901
බැංකු ගාස්තු	6,256.14	427
පිරිසිදු කිරීමේ වියදම්	46,000.00	126,500
ප්‍රදර්ශන සඳහා වියදම්	-	13,000
පරිවර්තන ගාස්තු	-	21,850
වෙබ් අඩවියක් ආරම්භ කිරීමේ ගාස්තු	15,027.86	10,715
විවිධ වියදම්	12,639.00	62,892
පිරිත් පිංකම සඳහා වියදම්	4,420.00	8,480
නිතිඥ ගාස්තු	109,000.00	188,500
	5,742,067.84	**5,427,956**

8 ශුද්ධ මූල්‍ය ආදායම්

පොළී ආදායම	9,588,896.06	9,191,331
සේවක ණය මත පොළී ලැබීම්	28,410.66	28,489
	9,617,306.71	**9,219,820**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

9 දේපල පිරියත හා උපකරණ

		2020/01/01 දිනට ශේෂය	වර්ෂය තුළ එකතු කිරීම්	මාරු කිරීම්	වර්ෂය තුළ ඉවත් කිරීම්	2020/12/31 දිනට ශේෂය
		රු.	රු.	රු.	රු.	රු.
සලකනු ලබන පිරිවැය						
යන්ත්‍ර	ප්‍රධාන කාර්යාලය	76,181,881.08	-	-	-	76,181,881.08
පරිගණක	ප්‍රධාන කාර්යාලය	10,273,147.46	39,000.00	-	-	10,312,147.46
පිරිවැය						
ලී බඩු හා සවිකිරීම් -	ප්‍රධාන කාර්යාලය	1,758,550.29	31,837.00	-	-	1,790,387.29
	මාතලේ ශාඛාව	8,700.00	-	-	-	8,700.00
කාර්යාල උපකරණ -	ප්‍රධාන කාර්යාලය	844,608.88	55,564.06	-		900,172.94
	මාතලේ ශාඛාව	5,750.00	-	-	-	5,750.00
පුස්තකාල පොත්		732,495.89	-	-	-	732,495.89
ඉවුම් පිහුම් හා අනෙකුත් උපකරණ		28,626.90	-	-	-	28,626.90
බුමුතුරුණු		314,945.80	-	-	-	314,945.80
නාම පුවරුව		235,910.60	-	-	-	235,910.60
එකතුව		**90,384,616.90**	**126,401.06**	**-**	**-**	**90,511,017.96**

ක්ෂයවීම්		2020/01/01 දිනට සමුච්චිත ක්ෂය	වර්ෂය තුළ ක්ෂය කිරීම	අපහරණයන්	වර්ෂය තුළ ඉවත් කිරීම්	2020/12/31 දිනට සමුච්චිත ක්ෂය
		රු.	රු.	රු.	රු.	රු.
සලකනු ලබන පිරිවැය						
		7,145,081.25	7,311,141.57	-	-	14,456,222.82
යන්ත්‍ර	ප්‍රධාන කාර්යාලය	9,310,291.21	596,725.42	-	-	9,907,016.63
පරිගණක	ප්‍රධාන කාර්යාලය					
පිරිවැය						
ලී බඩු හා සවිකිරීම්	ප්‍රධාන කාර්යාලය	1,032,025.39	136,212.37	-		1,168,237.76
	මාතලේ ශාඛාව	8,700.00	-	-	-	8,700.00
කාර්යාල උපකරණ -	ප්‍රධාන කාර්යාලය	648,830.53	32,144.41	-	-	680,974.94
	මාතලේ ශාඛාව	5,750.00	-	-	-	5,750.00
පුස්තකාල පොත්		727,890.82	2,847.37	-	-	730,738.19
ඉවුම් පිහුම් හා අනෙකුත් උපකරණ		15,710.30	1,932.70	-	-	17,643.00
බුමුතුරුණු		310,937.33	4,008.48	-	-	314,945.81
නාම පුවරුව		92,868.55	23,051.06	-	-	115,919.61
එකතුව		**19,298,085.39**	**8,108,063.38**	**-**	**-**	**27,406,148.76**
ශුද්ධ පොත් අගය		**71,086,531.51**				**63,104,869.20**

දෙසැම්බර් 31 දිනට		සටහන්	2020 රු.	2019 රු.
10	**අස්පෘෂ්‍ය වත්කම්**			
	පරිගණක මෘදුකාංග			
	පිරිවැය			
	වසරේ ආරම්භක ශේෂය		234,565.00	234,565
	එකතුකිරීම්		-	-
	අඩමාණ ණය සඳහා වෙන්කිරීම්		-	-
	වසර අවසාන ශේෂය		**234,565.00**	**234,565**
	සමුච්චිත කපා හැරී අගය			
	වසරේ ආරම්භක ශේෂය		234,565.00	231,594
	ක්‍රමක්ෂය		-	2,971
	වසර අවසාන ශේෂය		**234,565.00**	**234,565**
	වසර අවසාන ශුද්ධ ශේෂය		**-**	**-**
11	**වෙළඳ හා අනෙකුත් ලැබීම්**			
	ණයගැතියන්	**11.1**	3,833,015.50	5,109,750
	කාර්ය මණ්ඩල ණය ගැතියන්	**11.2**	657,093.99	1,049,351
			4,490,109.49	**6,159,101**
11.1	**ණය ගැතියන්**			
	ණයගැතියන් - ප්‍රධාන කාර්යාලය		13,016,965.50	10,608,700
	මාතලේ ශාඛාව		769,950.00	808,700
			13,786,915.50	**11,417,400**
	අඩමාණ ණය සඳහා වෙන්කිරීම් - ප්‍රධාන කාර්යාලය		(9,332,450.00)	(5,782,200)
	මාතලේ ශාඛාව		(621,450.00)	(525,450)
			3,833,015.50	**5,109,750**
11.2	**කාර්ය මණ්ඩල ණය ගැතියන්**			
	ණය - එම්. ටී. ඩී. විජේසිරි		166,672.00	250,000
	චමල් හෙට්ටිආරච්චි		353,962.00	525,286
	ඩබ් ඒ. එම්. ලංකාතිලක		(655.01)	150,005
	පී.කේ.ඩී. ලියනගේ		129,615.00	124,060
	උත්සව දීමනා - ප්‍රධාන කාර්යාලය		6,250.00	-
	මාතලේ ශාඛාව		1,250.00	-
			657,093.99	**1,049,351**

දෙසැම්බර් 31 දිනට	2020	2019
	රු.	රු.
12 අත්තිකාරම් හා කලින් කල ගෙවීම්		
කලින් කල ගෙවීම්		
දේශන ගාස්තු - කොළඹ විශ්ව විද්‍යාලය	-	672,000
වෙබ් අඩවියක් ආරම්භ කිරීමේ ගාස්තු	11,468.06	11,205
මෘදුකාංග සේවා ගාස්තු - ශිෂ්‍ය දත්ත පදනම	7,300.00	7,300
	18,768.06	**690,505**
13 කෙටි කාලීන ආයෝජන		
භාණ්ඩාගාර බිල්පත්	3,326,999.34	3,067,187
භාණ්ඩාගාර බිල්පත් මත පොළී ලැබීම්	96,217.46	111,807
	3,423,216.80	**3,178,994**
ස්ථාවර තැන්පත්	104,268,185.37	94,095,635
ස්ථාවර තැන්පත් මත පොළී ලැබීම්	4,428,702.99	5,256,583
	108,696,888.36	**99,352,218**
	112,120,105.16	**102,531,212**
14 මුදල් හා මුදල් වලට සමාන දෑ		
මහජන බැංකුව - ජංගම ගිණුම් අංක i	1,872,392.98	5,046,060
ජංගම ගිණුම් අංක ii	1,321,122.91	735,373
අතැති මුදල්	36.00	5,071
	3,193,551.89	**5,786,504**
15 සමුච්චිත අරමුදල		
ජනවාරි 01 දිනට ශේෂය	114,569,245.04	99,859,883
විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙන් මාරු කිරීම	4,871,298.33	14,709,362
දෙසැම්බර් 31 දිනට ශේෂය	**119,440,543.37**	**114,569,245**
16 විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම්		
ජනවාරි 01 දිනට ශේෂය	1,595,960.00	1,401,291
වර්ෂය තුල වෙන් කිරීම්		
ප්‍රධාන කාර්යාලය	275,553.00	297,919
මාතලේ ශාඛාව	46,407.00	44,706
	1,917,920.00	**1,743,915**
වර්ෂය තුල ගෙවීම්	-	(147,955)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,917,920.00**	**1,595,960**

දෙසැම්බර් 31 දිනට		සටහන්	2020 රු.	2019 රු.
17	**ආධාර ලැබීම්**			
	ජනවාරි 01 දිනට ශේෂය		66,364,038.98	50,000,000
	මෙම වර්ෂය තුල ලැබීම්		-	18,065,681
	ලැබීම් ක්‍රමක්ෂය		(6,806,568.10)	(1,701,642)
	දෙසැම්බර් 31 දිනට ශේෂය		**59,557,470.88**	**66,364,039**
18	**වෙළඳ හා අනෙකුත් ගෙවීම්**			
	අත්තිකාරම්වලින් ලද ආදායම		15,350.00	1,649,350
	උපචිත වියදම්	**18.1**	1,996,119.55	2,075,259
			2,011,469.55	**3,724,609**
18.1	**උපචිත වියදම්**			
	ගිණුම්කරණ ගාස්තු සහ අනිකුත් වෘත්තීමය ගාස්තු		130,120.00	114,840
	විගණන ගාස්තු		1,264,680.00	1,002,480
	වැටුප් හා අතිකාල දීමනා		16,700.00	42,728
	ප්‍රායෝගික ගාස්තු - මූලස්ථානය		112,000.00	141,096
	දේශන ගාස්තු		176,500.00	177,160
	අන්තර්ජාල සේවා ගාස්තු		35,206.46	8,572
	සුභසාධන වියදම්		11,714.00	14,364
	ඒකාබද්ධ අරමුදල් -		83,861.39	83,861
	දුරකථන - මූලස්ථානය		15,960.00	7,439
	මාතලේ		3,650.00	-
	ඡායා පිටපත් වියදම්		58,320.00	17,761
	තොරතුරු තාක්ෂණ උපකරණ ගාස්තු		6,000.00	6,000
	ප්‍රසාද දීමනා - මූලස්ථානය		-	366,677
	මාතලේ		-	50,000
	උපයන විට ගෙවන බදු		7,700.00	-
	විදුලිය - මාතලේ		11,747.70	2,500
	විභාග පරීක්ෂණ වියදම්		-	10,850
	අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට පැමිණීමේ දීමනා		6,000.00	6,000
	ගෙවිය යුතු විවිධ වියදම්		8,000.00	5,431
	පිරිසිදු කිරීමේ වියදම්		-	11,500
	විභාග ප්‍රශ්න පත්‍ර පරීක්ෂණ වියදම්		-	6,000
	ප්‍රචාරක වියදම්		11,960.00	-
	සම්බන්ධීකරණ ගාස්තු - (NVQ Print & Graphic Art Technology)		36,000.00	-
			1,996,119.55	**2,075,259**

19 සම්බන්ධිත පාර්ශවයන් සමඟ කරන ගනුදෙනු

ආයතනය හා සම්බන්ධිත පාර්ශවයන් සමඟ කරන ගනුදෙනු

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයෙහි සභාපති වන පී.කේ.ඩී. ලියනගේ මහත්මිය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලාධිපතිනිය ධුරය දරණු ලැබේ. පහත සඳහන් ගනුදෙනු මෙම සම්බන්ධිත පාර්ශව අතේ මෙම වර්ෂයේ සිදු වී ඇත.

	රු.
කුලිය, විදුලිය හා ජලය	311,250

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	සිඑම්/ඩී/එස්එල්අයිපී/එෆ්ඒ/01/20/179	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2021 දෙසැම්බර් 29 දින

ලේඛකාධිකාරි

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ එවමි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් - 01. ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය

02. ලේකම්, මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

මගේ අංකය / எனது இல. / My No. CAM/D/SLIOP/FA/01/20/179 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 දෙසැම්බර් 29 දින

ලේඛකාධිකාරී

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2019 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ විගණන මතය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වල පළමු ඡේදයහි පළමුවන කොටස අනුව භාණ්ඩ හෝ සේවා සපයන රාජ්‍ය ව්‍යාපාර සහ පොදු වගවීම (Public Accountability) සහිත ආයතන මෙම ගිණුම්කරණ ප්‍රමිත ගිණුම් සකස් කිරිමට පදනම් කර නොගත යුතු වුවද, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන තිබුණි.

(ආ) රාජ්‍ය ආයතනයක් විසින් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට 2018 සැප්තැම්බර් 18 දින පවරා දි තිබු විශාලත්වය හෙක්ටයාර් 0.1012 (පර්චසය 40) වූ ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් මැනීම සඳහා පුරෝකථනය කල ඒකක ණය ක්‍රමය (Projected Unit Credit Method) භාවිතා කරන බව ගිණුම්කරණ සටහන් වල දක්වා තිබුණද සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හි පරිච්ඡේද 28 හි 28.17 හෝ 28.18 වගන්ති ප්‍රකාරව ප්‍රතිලාභ වට්ටම් කිරීමක් සිදු කර නොතිබුණි.

(ඈ) ණයගැති වාර්තාව සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට වාර්ෂිකව ගෙවනු ලබන රු.72,000 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් සටහන් වී තිබුණි.

1.3 ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දිමට බලාපොරොත්තු වන මුද්‍රණ ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරිමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මුද්‍රණ ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට ,එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම ඇති බව නිගමනය කළහොත්,නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තව දුරටත් නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබේ නම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මුද්‍රණ ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණ කළ යුතුය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය පුකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/විධානයට යොමුව	නිරීක්ෂණ
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 10.2 වගන්තිය	රාජ්‍ය සේවකයෙකු නොවන ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකාවකට ආපදා ණය ලෙස රු. 72,215 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් නිරීක්ෂණ

සභාපතිවරයෙකු පත්කර නොතිබියදී, පාලක මණ්ඩලයේ සාමාජිකාවකට සභාපති දීමනාව ලෙස රු. 420, 000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න

විගණකාධිපති

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2019 අංක 19 දරන ජාතික විගනන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගනකාධිපති වාර්තාව/ප්‍රශ්න හා පිළිතුරු.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ප්‍රශ්ණයඃ-

(අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වල පළමු ඡේදයෙහි පළමුවන කොටස අනුව භාණ්ඩ හෝ සේවා සපයන රාජ්‍ය ව්‍යාපාර සහ පොදු වගවීම (Public Acountability) සහිත ආයතන මෙම ගිණුම්කරණ ප්‍රමිත ගිණුම් සකස් කිරීමට පදනම් කර නොගත යුතු වුවද, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන තිබුණි.

පිළිතුරු -

(අ) මේ සම්බන්ධව අපගේ වරලත් ගණකාධිකාරීන් වන ඩී. එච්. පී. මුණවීර අයතනයෙන් විමසන ලදුව ඔවුන්ගේ මතය ඔබ වෙත දන්වා එවමි.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මූල්‍ය වාර්තා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඇත. මෙම මූල්‍ය වාර්තා වැරදි පදනමක් මත පිළියෙල කර ඇති බව විගණන වාර්තාවේ සඳහන්ව තිබුණි. එනමුත් ඔබ විසින් කරන ලද පැහැදිලි කිරීම් අනුව මෙම ආයතනය භාණ්ඩ විකුණනු ලබන හෝ සේවා සපයන රාජ්‍ය සංස්ථාවක් නොවන නිසා තවදුරටත් ආයතනයේ මූල්‍ය වාර්තා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කළ යුතු බව අපගේ අදහස වේ.

ප්‍රශ්ණයඃ-

(ආ) රාජ්‍ය ආයතනයක් විසින් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට 2018 සැප්තැම්බර් 18 දින පවරා දී තිබූ විශාලත්වය හෙක්ටයාර් 0.1012 (පර්චසය 40) වූ ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

පිළිතුරුඃ-

(ආ) මෙම ඉඩමෙන් කොටසක් මෙගා පොලිස් ආයතනය මගින් ලෙස්ලි රණගල මාවත පුලුල් කිරීම සඳහා අත්පත් කරගන්නා ලදී. නැවත මිනුම්ගත කොට අවශ්‍ය කටයුතු කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ.

ප්‍රශ්නයඃ-

(ඇ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් මැනීම සඳහා පුරෝකථනය කල ඒකක ණය ක්‍රමය (Projected Unit Credit Method) භාවිතා කරන බව ගිණුම්කරණ සටහන් වල දක්වා තිබුණ ද සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හි පරිච්ඡේද 28 හි 28.17 හෝ 28.18 වගන්ති ප්‍රකාරව ප්‍රතිලාභ වට්ටම් කිරීමක් සිදු කර නොතිබුණි.

පිළිතුරුඃ-

(ඇ) ඉදිරියේ දී මේ සම්බන්ධව කටයුතු කිරීම සඳහා සටහන් කරගන්නා ලදී.

ප්‍රශ්නයඃ-

(ඈ) ණයගැති වාර්තාව සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට වාර්ෂිකව ගෙවනු ලබන රු. 72,000 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් සටහන් වී තිබුණි.

පිළිතුරු:-

(ඇ) ඉදිරියේ දී මේ සම්බන්ධව නිවැරදිව කටයුතු කිරීම සඳහා සටහන් කර ගන්නා ලදී.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

ප්‍රශ්නය:-

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගනන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/විධානයකට යොමුව	නිරීක්ෂණ
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 10.2 වගන්තිය	රාජ්‍ය සේවකයෙකු නොවන ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකාවකට ආපදා ණය ලෙස රු. 72,215 ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි

පිළිතුරු:-

2.2.2. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ සභාපතිතුමියට ආපදා ණය ලබා දී ඇත්තේ ගිවිසුම් ප්‍රකාරව හා එම ණය මුදල් සඳහා 4.2% ක පොළී මුදලකට යටත්වය. ස්වයං උත්පාදන ආයතනයක් හැටියට ආයතනයේ සියලුම අරමුදල් නිසි පරිදි කලමනාකරණය කොට ආයතනය ලාභදායකව පවත්වාගෙන යනු ලැබේ.

3. වෙනත් නිරීක්ෂණ

ප්‍රශ්නය:-

සභාපතිවරයෙකු පත්කර නොතිබියදී. පාලක මණ්ඩලයේ සාමාජිකාවකට සභාපති දීමනාව ලෙස රු. 420,000 ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි.

පිළිතුරු:-

පාලක මන්ඩලයේ සාමාජිකයන් විසින් සභාපතිවරයෙකු යෝජනා කොට පත් කිරීමට සිදුවූයේ එවකට රජය විසින් දීර්ඝකාලයක් සභාපති තනතුරට පුද්ගලයෙකු පත්නොකල බැවිනි. මේ බව අමාත්‍යාංශයේ එවකට සිටි ලේකම් තුමාට දන්වා ඔහුගේ අනුදැනුම ඇතිව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ව්‍යවස්ථාවට අනුව පාලක මණ්ඩලයේ සාමාජිකයෙක් අනිකුත් සාමාජිකයින්ගේ කැමැත්ත මත සභාපති තනතුරට තෝරා පත්කර ගන්නා ලදී. මෙම තීරණය පාලක මණ්ඩල වාර්තාවේ සඳහන් කර ඇත.

ආයතනික දියුණුව සඳහා ගන්නා ලද මධ්‍ය කාලීන ක්‍රියා මාර්ග

ආයතනයේ ඉලක්ක හා පරමාර්ථ කරා ළඟා වීම සඳහා පහත සඳහන් මාතෘකා ඔස්සේ ආයතනික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.

ප්‍රගති සාරාංශය

ඇතුලත් වුනු සිසුන් ගණන	-	582
පැවැත්වූ පාඨමාලා ගණන	-	12
මුළු ආධායම	-	රු.29,271,915.00
ලාභය	-	(රු.4,746,007.00)
තැන්පතු	-	රු.112,120,105.16

1. සේවා සැපයීමේ දියුණුව

1.1 පාඨමාලා

- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය දැනට පවත්වා ගෙන යනු ලබන පාඨමාලා එලෙසින්ම පහත සඳහන් ප්‍රධාන මාතෘකා යටතේ පවත්වා ගෙන යෑම.

පාඨමාලා

- **මුද්‍රණ තාක්ෂණය**
- **ග්‍රැපික්ස් තාක්ෂණය**
- **මල්ටිමීඩියා තාක්ෂණය**

- විවිධ වෘත්තීය මාර්ග ඔස්සේ මෙම පාඨමාලා සංවර්ධය කර ඇත.සියලු පාඨමාලා වසර 3 කට වරක් හෝ ගෝලීය තාක්ෂණික වෙනස්වීම් වලට අදාලව සංශෝධනය කරනු ලැබේ.

1.2 සම්මන්ත්‍රණ සහ වැඩමුළු

- පාසැල් හැරගිය සිසුන් සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වා ඒ ආශ්‍රයෙන් ක්ෂේත්‍රයේ වෘත්තීය සංවර්ධනයට මාර්ගෝපදේශ සපයනු ලැබේ.

- තාක්ෂණික වැඩමුලු පවත්වා ක්ෂේත්‍රයේ නියැලි සේවක මහතුන්ට නව තාක්ෂණය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දේ.මේ තුලින් ඔවුන් සතු කුසලතා සහ නුවණ වර්ධනය කෙරේ.

1.3 විශේෂ පුහුණු වැඩසටහන්

රජයේ සහ පෞද්ගලික ආයතන වල ඉල්ලීම අනුව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මුද්‍රණ ග්‍රැපික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයට අදාල පාඨමාලා අලලා විශේෂ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

1.4 මුද්‍රණ හා ග්‍රැපික්ස් ක්ෂේත්‍රය නැංවීම

- නව තාක්ෂණයට අනුව සීග්‍රයෙන් දියුණුවන මුද්‍රණ තාක්ෂණයට සරිලන ලෙස යන්ත්‍රෝපකරණ සහ මනුෂ්‍ය සම්පත් ප්‍රවර්ධනය කිරීම සහ ඊට අදාල පාඨමාලා සම්මන්ත්‍රණ, සංදර්ශන සහ වැඩමුළු වලට ආයතනය මෙන්ම සේවක මහතුන්ද සහභාගී කරවනු ලැබේ.

- On Line ක්‍රමයට පහත සඳහන් පාඨමාලා ආරම්භ කරන ලදී.
    - ග්‍රැෆික් ඩිසයින්
    - වෙබ් ඩිසයින්
    - Ms Office

- නවතම ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය අලලා Diploma in Digital Media / NVQ 5 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලාවට අදාල ජාතික නිපුණතා සම්මතය සහ නිපුණතා පාදක පුහුණු විෂය පාඨමාලාව සකස් කිරීම.

2. ආයතනික සේවාවන් ප්‍රසිද්ධ කිරීම සහ සංවර්ධනය

- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන සේවාවන් පිළිබඳ පුවත්පත් වාර්තා පල කිරීම සහ රූපවාහිනී ආයතනය සමග සාකච්ඡා පැවැත්වීම තුලින් දිවයිනේ සිසුන්ට ආයතනය පිළිබඳ දැනුවත් කිරීම.රජයේ ගැසට් නිවේදන ආධාරයෙන් පාඨමාලා ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම.

- නව තාක්ෂණික පහසුකම් සහිත වෙබ් අඩවියක් නිර්මාණය කර ඒ හරහා තොරතුරු සැපයීම හා දත්ත ලබා ගැනීම.

- ආයතනික ප්‍රචාරණය උදෙසා facebook & You tube තාක්ෂණය යෙදවීම.

- ISO 9001:2015 නව එලදායිතා සහතිකය ලබා ගැනීම

3. ආයතනික ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ආධාර ඇතිව බොරැල්ලේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට යාබදව පර්චස් 40 ක ඉඩමක් අත්පත් කරගෙන ඇත.මෙම නව ගොඩනැගිල්ල ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ධාරිතාව වැඩි කිරීම සඳහා ආධාර වන අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වඩාත් හොද පහසුකම් ලබා දීමටද අවස්ථාව උදා කර දේ.මෙම ඉදිකිරීම උදෙසා රජයෙන් ආධාර බලාපොරොත්තු වන අතර ඒ සඳහා දෙවන වරටත් ව්‍යාපෘති වාර්තාවක් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.

www.sliop.edu.lk